පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEAD QUARTERS, COLOMBO, SRI LANKA

තැ. පෙ. අංකය / த. பெ .இல. / P. O. Box No. 517

ෆැක්ස් / தொலைநகல் / Fax No. 011- 2329500

දුරකථනය / தொலைபேசி / Telephone 011-2384024 011-2395605

Website: www.police.lk

ඊ - මේල් / மின்-அஞ்சல் / E-Mail Policemedia@police.lk

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date

**2020.03.14 පැය 2330**
**ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / කර්තෘ,**
**මහත්මයාණනි / මහත්මියණි,**

## කොරෝනා වෛරසය පැතිරීම වැලැක්වීම සඳහා පූර්ව ක්‍රියාමාර්ග ගැනීම - මහජනයා ගැවසෙන උත්සව ආදිය තහනම් කිරීම.

අද වන විට ශ්‍රී ලංකාව තුළ කොරෝනා වෛරසය ආසාදිතවී ඇති බවට හඳුනාගත් තැනැත්තන් 10 දෙනෙකු රෝහල් ගතව වෛද්‍ය අධීක්ෂණය යටතේ ප්‍රතිකාර ලබමින් සිටී. මෙම තත්ත්වය මත කොරෝනා වෛරසය ආසාදිතව හඳුනා නොගත් තැනැත්තන් සමාජය තුළ ගැවසෙමින් සිටීමේ ඉඩ ප්‍රස්ථා බැහැර කල නොහැක.

එ බැවින් රජය විසින් වහාම ක්‍රියාත්මක වන පරිදි මහජනතාව විශාල වශයෙන් ගැවසෙන පොදු හෝ පෞද්ගලික මට්ටමෙන් පැවැත්වීමට සූදානම් කර ඇති සියලුම ප්‍රසිද්ධ රැස්වීම්, උත්සව ආදිය තහනම් කිරීමට පියවර ගෙන ඇත.

මේ සම්බන්ධයෙන් ශබ්ද වාහිනී යන්ත්‍ර යොදා ගනිමින් සෑම පොලිස් බල ප්‍රදේශයකම සියලු ජනතාව දැනුවත් කිරීමට වැඩ බලන පොලිස්පතිතුමා විසින් සියලු පොලිස් ස්ථාන දැනුවත් කිරීමටද කටයුතු කර ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ලෝක වසංගත තත්ත්වයක් බවට ප්‍රකාශ කර ඇති COVID 19 වසංගතය ශ්‍රී ලංකාව තුළ පැතිරීම වැලැක්වීම සඳහා 1897 අංක 3 දරණ රෝග නිරෝධායන හා වැලැක්වීමේ ආඥා පනතේ විධිවිධාන වලට අනුව රෝග නිරෝධායන රෙගුලාසි වලට පටහැනිව කටයුතු කරන ඕනෑම තැනැත්තෙකු පොලිස් නිලධාරියෙකු විසින් වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

එමෙන්ම ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ XiV වන පරිච්ඡේදයේ මහජන සෞඛ්‍ය හා ආරක්ෂාවට එරෙහිව වැරදි යටතේ 262 (ජීවිතයට අන්තරාදායක වූ යම් රෝගයක් බෝවීම පැතිරවීමට තුඩුදෙන නොසැලකිලිමත් ක්‍රියා) 263 (ජීවිතයට අන්තරාදායක වූ රෝගයක් බෝවීම පැතිරවීමට තුඩු දෙන ද්වේශ සහගත ක්‍රියා) සහ 264 (රෝග නිරෝධායන රීතියකට අකීකරුවීම) යන වගන්ති යටතේ රෝග නිරෝධායන සම්බන්ධ වැරදි දක්වා ඇති අතර, සියලුම වැරදි සම්බන්ධව පොලිස් නිලධාරියෙකුට වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගතහැකි වැරදි වේ.

ඉහත වැරදි ප්‍රතිපාදන යටතේ යම් තැනැත්තෙකු අත්අඩංගුවට ගැනීමට කටයුතු කල හොත් ඇප ලබාදීම සම්බන්ධයෙන් ඇප පනතේ ප්‍රතිපාදන වලට අදාල වියයුතු අතර එම පනතේ 6 (1) වගන්ති අනුව සිදුකරන වරදක් සම්බන්ධයෙන් මහජන ප්‍රතිචාරය සාමය කඩවීමක් විය හැකි බවට අදාල පොලිස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ මතය වන්නේ නම ඇප ලබා නොදී (සැකකරු හෝ සැකකරුවන්) අධිකරණයට ඉදිරිපත් කල හැකි අතර, එම පනතේ 14 වගන්තිය අනුව එම කාරණා මත මහේස්ත්‍රාත්වරයෙකු විසින් ඇප ලබා නොදී රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ හැකියාවද ඇත.

තවද, 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 107 (1) වගන්තිය ප්‍රකාරව යම් සංඥය වරදක් සිදු කිරීමේ වැලැක්වීමේ කාර්ය සදහා සෑම සාම නිලධාරියෙකු විසින්ම මැදිහත්වී ක්‍රියාකරනු ලැබිය හැකි අතර, එය තමාගේ උපරිම හැකියාව යොදා වැලැක්විය යුතුයි.

ඒ අනුව යම් තැනැත්තෙකු රෝග නිරෝධායනය හා වැලැක්වීමේ ආඥා පනත යටතේ ප්‍රතිපාදන හෝ රෝග නිරෝධායන රෙගුලාසි උල්ලංඝනය කරන්නේ නම් ඉතා දැඩිව නීතිය ක්‍රියාත්මක කරනු ඇත.

කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම සදහා ගත හැකි පූර්ව ක්‍රියා මාර්ග සම්බන්ධව ඔබ මාධ්‍ය මගින් මහජනා දැනුවත් කිරීම සදහා කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය,**
**පොලිස් මූලස්ථානය,**
**කොළඹ 01.**